**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2013**

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සරෙක් (Swedish Agency for Research Corporate with Developing Countries) ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.79,431 ක ශේෂයක් වර්ෂ 03 කට අධික කාලයක සිට අය නොවී පැවතුණි.

(ආ) නිමකළ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් 2010 වර්ෂයට අදාළ රඳවා ගැනීම් මුදල් රු.62,307 ක්, 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු.23,000 ක් සහ 2010 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු වියදම් රු.368,625 ක් 2014 සැප්තැම්බර් දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් 2012 වර්ෂයේ අවසන් වූ ව්‍යාපෘති සඳහා වෙනත් බාහිර පාර්ශවයන්ගෙන් ලද ප්‍රදානයන් වලින් ඉතිරි මුදල් රු.644,907 ක් බැරකම් ලෙස කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන ගිණුම්වල දක්වා තිබුණි.

**2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

වසර ගණනාවකට පෙර අවසන් වූ සරෙක් ව්‍යාපෘතියට අයත් රු. 5,463,897 ක් වූ ස්ථාවර වත්කම් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, එම වත්කම් භෞතිකව නිරීක්ෂණය නොවුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) | නියමාවලිය අනුව පශ්චාත් උපාධි වැඩසටහනක් තුළ විවිධ පාඨමාලා පැවැත්විය හැකි වුවත් එයින් බැහැරව සමාලෝචිත වර්ෂයේදී ආදායම් ඉපයීම සඳහා සහතික පත්‍ර පාඨමාලාවන් 02 ක් පවත්වා තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| | (i) 757(2)වගන්තිය | ස්ථාවර වත්කම් සමීක්ෂණයෙන් අනාවරණය වූ පරිදි වත්කම් ඒකක 161 ක ඌනතාවයක් පැවති අතර ඒ සම්බන්ධව වගකිව යුතු පාර්ශවයන් හඳුනා ඉදිරි පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) 1647 වගන්තිය | වාහනවලට අදාළ ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසන් වූ පුරාවිද්‍යාව පිළිබඳ පදනම් පාඨමාලාවේ අතිරික්තයෙන් සියයට 30 ක් වන රු.110,775 ක මුදලක්ද, අබියා (Annual Bibliography of Indian Archeaology) ව්‍යාපෘතියේ කටයුතුවල නිරතවීම වෙනුවෙන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී රු.120,000 ක දීමනාවක්ද භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඉ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කළයුතු වුවත් එසේ කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 1,823,191 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,243,555 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,066,746 ක පිරිහීමක් වූ අතර එම පිරිහීමට රජයේ ප්‍රදාන රු.4,157,703 කින් අඩුවීම සහ පෞද්ගලික පඩිනඩි, ගමන් වියදම් සහ වෙනත් මෙහෙයුම් වියදම් රු.2,237,590 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 අධ්‍යයන කාර්යසාධනය**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන වර්ෂ කීපයක ශිෂ්‍ය ලියාපදිංචිය, අවසන් විභාගයට පෙනී සිටීම හා විභාග සමත්වීම පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

(අ) පශ්චාත් උපාධි මට්ටමේ පාඨමාලා පැවැත්වීම

| අධ්‍යයන වර්ෂය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | අතහැර ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සියයට |
|---|---|---|---|---|---|
| 2010/2011 | 114 | 12 | 54 | 51 | 94 |
| 2011/2012 | 174 | 02 | 48 | 44 | 92 |
| 2012/2013 | 95 | - | 36 | 29 | 81 |

(i) 2012/2013 අධ්‍යයන වර්ෂයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 03 ක් ද, ශාස්ත්‍රපති පාඨමාලා 02 ක් ද, විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාර ද පාඨමාලා 01 බැගින් ද පවත්වා තිබුණි. මේ සඳහා වූ මුළු ශිෂ්‍ය ලියාපදිංචි සංඛ්‍යාව 95 ක් විය. පසුගිය වර්ෂයට වඩා සියයට 45 කින් ශිෂ්‍ය ලියාපදිංචියේ අඩුවීමක් නිරීක්ෂණය විය.

(ii) 2012/2013 අධ්‍යයන වර්ෂයේදී පුරාවිද්‍යා හා කෞතුකාගාර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 36 ක් වූ අතර, පසුගිය අධ්‍යයන වර්ෂය හා සැසඳීමේදි එය සියයට 25 කින් අඩුවීමක් නිරීක්ෂණය විය.

(iii) 2012/2013 අධ්‍යයන වර්ෂයේදී අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 29 ක් වූ අතර, එහි ප්‍රතිශතය සියයට 81 ක් විය.

(ආ) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වා තිබුණු පශ්චාත් උපාධි නොවන පාඨමාලාව සඳහා අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 98 ක් වූ අතර, සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 70 ක් විය. ඒ අනුව සමත් ප්‍රතිශතය 71.43 ක් විය.

(ඇ) 2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධයෙන් විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 03 ½ සිට 07 ½ දක්වාද, පශ්චාත් උපාධි නොවන පාඨමාලා සඳහා මාස 07 සිට 09 දක්වා වූ කාලයක් ද ගත වී ඇති බව නිරීක්ෂණය විය.

## 4.2 කළමණාකරන අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 පෙබරවාරි 14 දින ආයතනයේ පවත්වන ලද අංක 239 දරන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ආයතනයේ මූල්‍ය පාලනය පිළිබඳ සහතික කිරීමේ බලතල 2012 නොවැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු.2,000,000 දක්වා සහකාර මූල්‍ය අධිකාරීවරියටත් රු.2,000,000 ඉක්මවන ගනුදෙනු සඳහා නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරියටත් පවරා තිබුණද, රු.2,000,000 ඉක්මවන වැටුප් හා වේතන, දුරකථන, ජල විදුලි බිල්පත්, අර්ථ සාධක යන වියදම්ද සහකාර මූල්‍යාධිකාරීට සහතික කිරිමට කටයුතු කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නියෝජ්‍ය මූල්‍යාධිකාරීගේ කාර්යභාරය සීමාවී තිබුණි.

(ආ) ආචාර්ය රෝලන්ඩ් සිල්වා විසින් ආයතනයේ ශිෂ්‍යයින් සඳහා වාර්ෂික රන් පදක්කම් ප්‍රදානය කිරීමට හා මුදල් ප්‍රදානයන් ලබා දීම සඳහා රු.1,000,000 ක මුදලක් 2009 වර්ෂයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ලබා දී තිබුණි. ඒ වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දින දක්වාම රු.612,142 ක පොළී ආදායමක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද අරමුණට අදාළ කාර්යයන් කිසිවක් සිදුකර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ තොග ගැලපුම් ගිණුම ලෙස රු.41,505 ක ශේෂයක් 2007 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඈ) 2008 වර්ෂයේදී ගිවිසුම් හා බැඳුම්කර කඩකිරීමෙන් ලැබුණු රු.229,402 ක් වූ ලැබීම් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අරමුදල් ගිණුමකට මාරුකර තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දක්වා ආයෝජනය නොකර බැංකු ජංගම ගිණුමේ තැන්පත් කර තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 39 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 33 ක් වේ. ඒ අනුව පුරප්පාඩු 06 ක් විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2013 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ඉටුකළ යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 16 ක් විය. එයින් ප්‍රධාන ක්‍රියාකාරකම් 04 ක් වර්ෂය තුළ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති අතර ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් සඳහා වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන වලින් සියයට 84 ක ඉතිරියක් පැවතුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ අවධානයට වරින්වර යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වේ.

(අ) ස්ථාවර වත්කම්
(ආ) පුස්තකාල
(ඇ) වාහන
(ඈ) මූල්‍ය බලතල පැවරීම
(ඉ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම, පිටවීම සහ නිවාඩු